BKT0230
26/08/2023

01 NOV 2001
කොළඹ - 01.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# 2001 මහ මැතිවරණය
# පොදු ජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනය

2001 මහ මැතිවරණය
පොදු ජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනය

# පෙරවදන

ශ්‍රී ලංකාවේ 11 වන පාර්ලිමේන්තුව සඳහා වන මහ මැතිවරණය 2001 දෙසැම්බර් මස 5 වන දිනට යෙදී තිබේ. මෙම මහ මැතිවරණය මෙරට පළල් මහ ජනතාව ඉල්ලා සිටි මැතිවරණයක් නොවේ. එහෙත් අත්‍යවශ්‍ය දේශපාලන තීන්දුවක් ගැනීම සඳහා දේශපාලන තත්වයන් විසින් මතු කරනු ලැබූ මැතිවරණයකි. එක්සත් ජාතික පක්ෂය ගෙනගියා වූ දුර්දාන්ත ජනතා ද්‍රෝහී විනාශකාරී පාලන තන්ත්‍රය පෙරලා දමා මනුෂ්‍යත්වය හා ජන ගරුත්වය සුරකිමින් අප රටට සාමයත්, සමෘද්ධියත්, සංවර්ධනයත් ළඟා කරවීමෙහි ලා සමත් වන්නා වූ ප්‍රතිපත්තිමය ඉදිරි දර්ශනයක් හා වැඩ පිළිවෙලක් ඉදිරිපත් කළ පොදුජන එක්සත් පෙරමුණ බලයට පත් කිරීමට මීට සත් වසරකට පෙර එනම් 1994 දී මෙරට බහුතර ජනතාව විප්ලවීය පියවරක ගත්හ. ඊට පසුව එළඹි සෑම ලොකු කුඩා මැතිවරණයකදී ම අප රටේ බහුතර ජනතාව පොදු ජන එක්සත් පෙරමුණේ එම වැඩපිළිවෙළ අනුමත කළහ.2000 ඔක්තෝම්බර් මැතිවරණයේදී ද සිදුවූයේ එයයි. එය මෙර ට මැතිවරණ ඉතිහාසයේ ප්‍රගතිශීලී කඳවුර විසින් සනිටුහන් කරනු ලැබූ වාර්තාගත විජයග්‍රහණයකි. රට ගොඩ ගැනීමට කිසිදු වැඩපිළිවෙලක් නැති හුදු බලලෝභයෙන් පමණක් පෙළෙන අන්ත දක්ෂිණාංශික සොච්ච ජනතාවගේ ඡන්දයෙන් තමන්ට ලබා ගත නොහැකි බලය කුමන්ත්‍රණ බලයෙන් ලබා ගැනීමේ කුහකව ක්‍රියාදාමය වේගවත් කළේ 2000 ඔක්තෝම්බරයේ දී පොදු ජන එක්සත් පෙරමුණ දෙවන වරටත් ලැබූ විජයග්‍රහණය දැක වියරු වූ තැනැ යටතේය. රට පුරා කෝලාහල පවත්වමින්, ත්‍රස්තවාදයට ඉඩ දෙමින්, ජාවාරම් කරුවන්ගෙ කළු සල්ලි බලයෙන් විවිධ අගති ක්‍රියා කරමින් එකී දක්ෂිණාංශික බලවේගය පසුගිය වසර පුරාම එළිපිටම කළාවූ දේශපාලන අපයෝජනය මෙරට ජනතාවට මැනවින් දැක ගන්නට හැකිවිය. මෙම දුෂ්ට හවුලේ අවසාන තුරුම්පුව වූයේ ඒ වන විට පොදු ජන එක්සත් පෙරමුණ තුළ ද දූෂිතයින් හා ද්‍රෝහීන් බවට පත් වී සිටි අතළොස්සක් ද ජාවාරම්කරුවන්ගේ මුදල් බලයෙන් තම පිළට ඇදා ගනිමින් ජනතා බලය සොරා ගැනීමයි. එම දුෂ්ට කුමන්ත්‍රණය එක රැයකින් පරාජය කිරීමට පොදු ජන එක්සත් පෙරමුණු නායකත්වයට හැකි වී තිබේ. දැන් රටේ දේශපාලන බලවේග පැහැදිලිවම දෙකට බෙදෙමින් පවතී. එක් පසෙකින් හිංසකයින්, දූෂිතයින්, මාපියා ජාවාරම්කරුවන්, ; ka jdkaydwjiadjdk එක්සත් ජාතික පක්ෂය වටා අශුද්ධ සන්ධානයක් ලෙස ගොනු වූ අලුගෝසු හවුලයි. අනෙක් පසින් මෙරට සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, ජන ගරුත්වය සුරකින දේශපාලනය හා ජනතාව සවිබල ගන්වන සංවර්ධනය උදෙසා පෙනී සිටින ප්‍රගතිශීලීන් හා දේශප්‍රේමී පොදු ජන එක්සත් පෙරමුණ වටා ගොනු වූ මනුෂ්‍යත්වයේ සන්ධානයයි. මෙවර මහ මැතිවරණය එළඹී ඇත්තේ මේ බලවේග දෙකෙන් කවරකට බලය හිමි විය යුතුද යන දේශපාලන තීන්දුව ගැනීම සඳහා ජනතාවට අවස්ථාවක් ලබා දීම පිණිසය. ඒ අනුව මෙම මහ මැතිවරණය 21 වන ශතවර්ෂයේ ශ්‍රී ලංකාවේ අනාගතය තීන්දු කරන්නාවූ තීරණාත්මක මැතිවරණයකි.අලුගෝසු හවුලට එරෙහි මනුෂ්‍යත්වයේ සන්ධානය ලෙස පොදු ජන එක්සත් පෙරමුණ මෙවර ඉදිරිපත් කරන්නේ 1994 දී මෙරට ජනතාව විජයග්‍රහණයකින් සනිටුහන් කරවූ අපරාජිත ප්‍රතිපත්තිමය ඉදිරි දර්ශනය පදනම් කර ගත් එහි ම අඛණ්ඩත්වය පෙන්නුම් කරන්නා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයකි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# පොදු ජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයයි.

බියෙන් සැකෙන් තොරව ජීවත් විය හැකි ජන ගරුත්වය සුරකින දේශපාලන සංස්කෘතියක් ගොඩ නැගීමට,

යුද්ධය, ජාතිවාදය පිටු දකිමින් තිරසාර සාමයක් උදා කර ගැනීමට,

දිළිඳුකම පිටු දකිමින් ජනතාව සවිබල ගන්වන්නා වූ වේගවත් තිරසාර ආර්ථික සංවර්ධනයක් ගොඩ නැගීමට

නීතිය සාමය මිනිස් නිදහස රජයන ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක් තහවුරු කිරීමට.

රට මහජනතාවට ඇති පරම අයිතිය සහතික කෙරෙන ලෙස සැලසුම් කර ඇති මේ අනාගත වැඩ පිළිවෙල ඔබට අභියෝග ඒ වුව ආරක්ෂා කරමින් ජන අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක කෙරෙන බවට ප්‍රතිඥා දෙමින් ගෞරව බහුමානයෙන් හා ආදරයෙන් ඔබ වෙත පුද කරමු.

## දර්ශනය

ජනතාව සවිබල ගන්වන ශක්තිමත් ආර්ථිකයකින් යුක්ත වූද, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, මූලික අයිතිවාසිකම්, හා සමාජ සාධාරණත්වය සහතික කළ ස්ථාවර සමාජයකින් යුක්ත වූ ද, සදාචාර සම්පන්න හා වගකීම් සහගත දේශපාලනයක් මගින් මෙහෙයවන ජනතාවට ලෙන්ගතු රජයකින් යුක්ත වූ ද, ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී හා මිත්‍රශීලී ශ්‍රී ලංකාවක් ගොඩ නැගීම අපගේ දර්ශනය වන්නේය.

## තිරසාර සාමයක්

රටේ කේන්ද්‍රීය අර්බුදය ලෙස අප දකින්නේ ජනවාර්ගික අර්බුදයත් එයම හේතුවක් කරගනිමින් බිහිවී ඇති යුද්ධයත්ය. නිදහසින් පසු ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩ නැගීමේදී නොවිසඳා ගත් ජාතික ගැටළුව යුද්ධයක් බවට පරිවර්තනය වූයේ එක්සත් ජාතික පක්ෂයේ දුර්දාන්ත පාලනය යටතේ 1983 දී ඇති වූ කළු ජූලි ඛේදවාචකයෙන් පසුවයි. 1994 න් පසු එක්සත් ජාතික පක්ෂය ඇතුළු ප්‍රතිගාමීත්වයේ සකලවිධ බාධා මධ්‍යයේ වුව ද ජාතික ගැටළුවට දේශපාලන විසඳුමක් නිර්මාණය කර ගැනීමේ පදනම ස්ථාපනය කිරීමට පොදු ජන එක්සත් පෙරමුණු රජයට හැකි විය. ඒ අනුව තිරසාර සාමයක් උදෙසා එකිනෙකට සමාන්තර ක්‍රියා මාර්ග තුනක් ඔස්සේ සංයුක්ත වැඩපිළිවෙලක් ඉදිරිපත් කරනු ඇත.

ත්‍රස්තවාදය පිටු දැකීම.
දේශපාලන විසඳුමක් ඉලක්ක කර ගත් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
ජාතික ඒකාබද්ධතාව ගොඩ නැගීම යනු එම ක්‍රියා මාර්ග තුනයි.

# 3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා රජය

## රටට ගැලපෙන නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක්

1948 පටන් භාවිතයට ගනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මෙන්ම දැනට ක්‍රියාත්මක වන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවද රටේ සමාජ අර්බුද උග්‍ර කරන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. 1978 ව්‍යවස්ථා මර උගුලෙන් ගැලවීම සඳහා අප දැරූ ප්‍රයත්නයන් ව්‍යර්ථ වූයේ නව ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීම සඳහා අප යෙදූ උපක්‍රමයන් 1978 ව්‍යවස්ථාවම මගින් නිර්මාණය කරනු ලැබූ කඩාකප්පල්කාරී දේශපාලන සංස්කෘතිය තුළ සිරවූ බැවිනි. රටට ගැලපෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පළල් මහජන සම්මුතියක් මගින් ඇතිකර ගැනීම උදෙසා අපි ජන වරමක් ඉල්ලා සිටිමු.

එවැනි ව්‍යවස්ථාවක මෙන්ම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ලෙස අප ඉදිරිපත් කරන්නා වූ ප්‍රධාන දේශපාලන ප්‍රතිසංස්කරණ කීපයක ද මූලික ලක්ෂණ පහත දැක්වේ.

## විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හා නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වාදීම.

යෝජිත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් මගින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනු ඇත. ජනතාවගේ විධායක බලය සෘජුවම පාර්ලිමේන්තුවට වගකියන්නාවූ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක කරනු ඇත. මෙම ප්‍රතිසංස්කරණය සෘජුවම මැතිවරණ ක්‍රම ප්‍රතිසංස්කරණ සමග සම්බන්ධ වනු ඇත. ඒ අනුව අප හඳුන්වා දෙන්නට බලාපොරොත්තුවන නව මැතිවරණ ක්‍රමයේ මූලික ලක්ෂණ පහත දැක්වෙන පරිදිය.

සමානුපාතික ක්‍රමය, කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය හා විශේෂ නියෝජන ක්‍රමය යන නියෝජන මූලධර්ම තුන දේශීය තත්වයන්ට ගලපා ගනිමින් සකස් කරන්නා වූ සංයුක්ත මැතිවරණ ක්‍රමයක් වීම.

මනාප පොරය අහෝසි කරමින්, ගමට මන්ත්‍රීවරයකු ලබා දෙමින් ඡන්දදායකයා හා මන්ත්‍රීවරයා අතර වගකීම් සහගත සබඳතාවක් ගොඩනැගීම.

දිස්ත්‍රික් හා ජාතික සමානුපාතික නියෝජනය මගින් ජනවාර්ගික හා සංඛ්‍යාත්මක වශයෙන් වූ සුළුතර පක්ෂවල නියෝජනය සහතික කිරීම.

ආණ්ඩු බලය ලබා ගන්නා පක්ෂයකට දෛනික වැඩ කටයුතු කරගෙන යා හැකි අන්දමට ආසන බහුතරයක් ලබා දීමට ඉඩ සලසමින් ස්ථාවර පාලනයක් සහතික කිරීම.

## බලය බෙදා හැරීම

රටේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කර ගනිමින් රටේ සුළු ජන කොටස් බහුවිධ ප්‍රජාතන්ත්‍රවාදයේ සාධනීය හවුල් කරුවන් ලෙස දිරිමත් කරන්නාවූ බලය බෙදා හැරීමේ ක්‍රමයක් සියලුම පාර්ශ්වයන් හි උපරිම සහභාගිත්වය සහිත බිහිවන පුළුල් සම්මුතියක් අනුව හඳුන්වා දෙනු ඇත.

## ස්වාධීන කොමිෂන් සභා

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දෙනු ලැබූ සියලුම කොමිෂන් සභා සජීවී ලෙස ක්‍රියාත්මක කිරීමට හා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළද ඒවා තව දුරටත් ශක්තිමත් කිරීමද සිදු කෙරෙනු ඇත.

## මානව අයිතිවාසිකම්

එජාප පාලන සමයේ දී නමට පමණක් සීමා වී තිබූ මානව අයිතිවාසිකම් ජනතාවට නියම වශයෙන් හිමි වූ යථාර්තයක් බවට පත්වූයේ පොදු පෙරමුණු පාලන සමය තුළය. මානව හිමිකම් කොමිෂම පිහිටුවීම ඒ සඳහා ගත් එක් පියවරකි. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් මෙන්ම ආර්ථික හා සාමාජික අයිතිවාසිකම් ද ඇතුළත් වන පරිදි මානව අයිතිවාසිකම්වල ශ්‍රී ලාංකික විෂය පථය පුළුල් කරමින් ජනතාවගේ නන් වැදෑරුම් නිදහස හා අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස නෛතිකව තහවුරු කෙරෙනු ඇත.

මානව අයිතිවාසිකම් අධ්‍යාපනය ද, මානව අයිතිවාසිකම් සුරැකීමේ විවිධ ආයතන ද, මානව අයිතිවාසිකම් සුරැකෙන සේ ගෘහස්ථ නීති පද්ධතිය ද සංවර්ධනය කෙරෙනු ඇත.

# 4 ආර්ථිකය

## ජනතාව සවිබල ගන්වන ආර්ථිකයක්

අපගේ ආර්ථික දර්ශනය වන්නේ රටේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵල රටේ බහුතර ජනතාවගේ ජීවන අභිවෘද්ධිය වෙනුවෙන් යොමු කරවීමයි. ඒ අනුව පාරිභෝගික සමාජයක් නිෂ්පාදන සමාජයක් බවට පරිවර්තනය කරමින් ජනතාව සවිබල ගන්වන්නා වූ වේගවත් ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ඇත.

අප පිළිගන්නා නිදහස් වෙළඳ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ජනතාවගේ ජීවනෝපායයන් සුරක්ෂිත කිරීමටත් [illegible] ආර්ථික [illegible] ආර්ථික වැඩසටහන් වල ප්‍රතිලාභ සමාජයේ පහළම තීරුවෙත ගලා යන අයුරින් ක්‍රියාත්මක කරනු ඇත.

1994 දී රුපියල් 32414 ක් වූ ඒක පුද්ගල ආදායම 1998 වන විට රුපියල් 54035 දක්වා වැඩිකළ අප රජය 2005 වන විට එය රුපියල් 84000 දක්වා ඉහළ නංවනු ඇත.

පසුගිය සය වසර තුළ 5% ආර්ථික සංවර්ධන වේගයක් පවත්වාගත් අප ඉදිරි වසර පහ තුළ එය 8% දක්වා වර්ධනය කිරීමට කටයුතු කරනු ඇත.

## ව ආර්ථික කළමණාකරනයක්

රටේ සමස්ථ සංවර්ධන ක්‍රියාවලිය ඉහල නිමැවුම් මට්ටමකට ගෙන ඒම සඳහා එහි කළමනාකරනය භාර රාජ්‍ය සේවයේ සියලු කොටස් වල ඵලදායීතාව ඉහල නැංවීමට ක්‍රියාකිරීම උදෙසා අප රජය විසින් ආරම්භ කළ ක්‍රියාවලිය වඩාත් සංවර්ධනාත්මකව ඉදිරියට පවත්වාගෙන යනු ඇත.

වැඩ කරන ජනතාව, වෘත්තිකයින් ,ආරක්ෂක සේවාවන්හි නියුතු නිලධාරීන් ඇතුළු සියලු ක්ෂේත්‍රවල ඵලදායිතාව නැංවීමට කටයුතු කරන්නෙමු.

ව්‍යවසායකයින් ,ආයෝජකයින්, කළමනාකරුවන් ,ව්‍යාපාරිකයින්, නිෂ්පාදකයින් ඇතුළු දේශීය ආර්ථිකයේ සියලු කොටස්කරුවන් ශක්තිමත් කර ඔවුන් සංවර්ධනයේ ප්‍රමුඛ බලවේගය ලෙස පිළිගනිමින් අවශ්‍ය සියලු සහයෝගය ලබා දෙනු ඇත.

ආයෝජකයින්ට සහන සැලසීම සඳහා සුවිශේෂ අරමුදලක් ඇතිකෙරෙනු ඇත.

රටේ මූල්‍ය පාලනයේ ඵලදායිතාව වැඩි කිරීමට හා කාර්යක්ෂම කිරීමට ක්‍රියා කරනු ඇත.

බැංකු ණය ගෙවීම පැහැර හැර සිටින්නන් හා රාජ්‍ය දේපළ ගසා කෑ පුද්ගලයින් නීතියේ රැහැනට හසු කිරීම පිණිස සුවිශේෂ නව නීති පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගැනීමට ක්‍රියාකරනු ඇත.

අයවැය හිඟය අඩුකිරීමටත් බැංකු පොලී අනුපාතයන් 7% දක්වා අඩු කිරීමටත් එමගින් නිෂ්පාදකයින්ට, බෙදාහරින්නට සේවා සපයන්නන්ට හා පුද්ගලිකව නය ලබා ගන්නා අයට සැලසෙන මූල්‍ය පහසුකම් පුළුල් කිරීමට කටයුතු කරනු ඇත..

සාමාන්‍ය ජනතාවට අවම බදු බරක් ඇතිවන පරිදි රජයේ ආදායම් ක්‍රමවත් වී [illegible] භාණ්ඩ හා සේවා බදු ප්‍රතිව්‍යුහගතකරණය කරමට අපි දීර්ඝ [illegible] ක්‍රියා කරන්නෙමු. එමෙන්ම අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල [illegible] ඇඳුම් හා [illegible] විශේෂ සහන සැලසීමට අප විසින් දැනටමත් පියවර ගෙන ඇත. අපගේ මෙම ජනතාවාදී ප්‍රවේශය ඉදිරියට ද අඛණ්ඩව ගෙනයනු ඇත.

## කර්මාන්ත

වෙළඳපල ආර්ථිකයේ අහිතකර ගෝලීය ප්‍රවණතාවන්ට ඔරොත්තු දෙමින් තරගකාරීත්වයට මුහුණ දිය හැකි දේශීය කර්මාන්ත ප්‍රමුඛත්වයක් ඇති කිරීමට අවශ්‍ය පදනම් ශක්තිමත් කිරීමටත් ඒ සඳහා ආයෝජකයින් හා ව්‍යවසායකයින් වැඩි වශයෙන් දිරිමත් කිරීමටත් ශ්‍රී ලංකාවේ සම්පත් පදනම සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීය සංවර්ධනයට රුකුල් දෙන්නා වූ භූගෝලීය ව්‍යාප්තියක් මෙම ක්ෂේත්‍රය තුළ ඇති කිරීමට අනුබල දීමටත්, විදේශ වෙළඳපළ තුළ ශ්‍රී ලංකාවට ලැබිය හැකි සාපේක්ෂ වාසිත් තහවුරු කර ගැනීම සහතික කරන්නා වූත්, අපගේ කාර්මික ප්‍රතිපත්තිය ශක්තිමත් ව ඉදිරියට ගෙන යාමට සහ ඊට ඉහලම රාජ්‍ය අනුග්‍රහය ලබා දීමට අඛණ්ඩව ක්‍රියා කරනු ඇත.

21 වන සියවස තුළදී කාර්මික සංවර්ධනයේ තෝතැන්න වනුයේ ආසියාවයි. චීනය හා ඉන්දියාව දැනටමත් දැනුම පදනම් කරගත් තාක්ෂණයේ (Knowledge Based Technology) හා තොරතුරු තාක්ෂණයේ පුරෝගාමීන් වී ඇති අතර මේ රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ භූ දේශපාලනමය පිහිටීමෙන් උපරිම ඵල නෙලාගත හැකි. සහ නව ලොවට ගැලපෙන අයුරින් අපගේ කාර්මික පදනම වෙනස් කිරීමටත්. ඊට අවශ්‍ය යටිතල පහසුකම් හා සුවිශේෂ කර්මාන්ත පුරයන් නිර්මාණය කිරීමටත් පමණක් නොව දැනට අපගේ කර්මාන්ත ක්ෂේත්‍රය ඇඟළුම් කර්මාන්ත අංශය කෙරෙහි පමණක් තබා ඇති දැඩි රැඳියාව අවම කිරීමට සහ වසර 2005 දී ඊට ජාත්‍යන්තර වෙළඳපල තුළ මුහුණ දීමට සිදුවන අභියෝගයන් ජය ගැනීම සඳහා. එය විවිධාංගීකරණයට ලක් කිරීමටත්, පවත්නා කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රමිතිගත සහ ඉහළ ඵලදායීතාවයක් සහ ආර්ථික විශ්ලේෂණයක් කිරීමටත් ඉහලම ප්‍රමුඛතාවය ඉදිරියට ද ලබා දෙනු ඇත.

ගන්නිමත් දේශීය ඖෂධ නිෂ්පාදන කර්මාන්තයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පිටුවහල ඉහල ප්‍රමුඛතාවකින් යුතුව ලබා දෙන්නෙමු.

## ආයෝජන කලාප

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

නව කාර්මික ක්ෂේත්‍රයන් ප්‍රාදේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමටත්, විදේශීය ආයෝජන ආකර්ශනය කිරීමටත් කොළඹින් බැහැරව දැනට ක්‍රියාත්මකවන හොරණ,පාදුක්ක,මල්වත්ත,මීරිගම,වතුපිටිවල,සීතාවක,පොල්ගහවෙල,මාවතගම,කොග්ගල හා පල්ලේකැලේ වැනි ප්‍රදේශවල අරඹා ඇති කර්මාන්ත පුරයන්ට අමතරව දිවයිනේ සෙසු පෙදෙස්වලත් නව ආයෝජන කලාපයන් ආරම්භකරනු ඇත.

නව ලෝකයේ තරඟකාරී වෙළඳපල ඉලක්ක කර ගත් කිරිවල් හා විදුලිත් තාක්ෂණයටව අදාල ක්ෂේත්‍රයන් , උසස් ගණයේ ඇගලුම්, ඉලෙක්ට්‍රොනික උපකරණ මෙන්ම රබර්, පොල් සවර්ණකරන, ඉංජිනේරු ආදී ආශ්‍රිත ක්ෂේත්‍රයන්වටත් මෙම ආයෝජන කලාප තුළ ප්‍රමුඛතාව ලැබෙනු ඇත.ආයෝජන කලාපයන් හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටත්, එවායේ සේවක සේවිකාවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමටත් වැඩ පිළිවෙළක් ක්‍රියාවට නංවනු ඇත. 2002 ජනවාරි මාසයේ දී මාලඹේ පිහිටි දිවයිනේ ප්‍රථම තොරතුරු තාක්ෂණ උද්‍යානයේ නිෂ්පාදන කටයුතු අරඹනු ඇත. අපගේ ඊළඟ රජය නව දැනුම, තාක්ෂණය හා කර්මාන්ත මෙරටට ගෙන එමට අනුගමනය කරන පුරෝගාමී මෙහෙවර දිගටම සිදු කරනු ඇත.

## සුළු කර්මාන්ත හා නිෂ්පාදකයින්

දේශීය ආර්ථිකයට සුවිශේෂ දායකත්වයක් සපයන මෙම ක්ෂේත්‍රය 1877 - 1994 එ.ජා.ප පාලන සමයේ දී නිදහස් ආනයනික සාක්ෂි මෙරට වෙළඳපලට ඇතුළු වීමට ඉඩ සලසා තිබීම් නිසාත් අවිධිමත්ව යොදුරු වී තිබූ අතර, මෙ ක්ෂේත්‍රය යළි ස්ථාපනය කරනු විස් එවායේ වෙළඳපල සුරක්ෂිත කිරීමටත්, එකී නිෂ්පාදන හා සේවාවන්ව ගුණාත්මකභාවය වර්ධනය කිරීමටත් පමණක් නොව දකුණු ආසියාතික විරතාත්මක ගිවිසුම් හරහා මෙම ක්ෂේත්‍රය තුළ කලාපීය වෙළඳපල විවෘත කිරදීමටත් පමණක් නොව එවාට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන ප්‍රතිපත්ති දිරි ගැන්වීමට හා අඩු පොළී අනුපාතිකයන් යටතේ මූල්‍ය පහසුකම් සැපයීමට ද අප රජය මේ තාක් ක්‍රියාත්මක කල ප්‍රතිපත්තීන් නොවෙනස්ව ඉදිරියටම ගෙන යනු ඇත.

# 6. තොරතුරු තාක්ෂණය

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ පවත්නා ලෝක ප්‍රවණතාවන් සැලකිල්ලට ගනිමින් අපගේ රජය ඒ සඳහා වූ වෙනමම අමාත්‍යාංශයක් ද ප්‍රථම වරට ඇති කළ අතර ඒ මගින් අදාල ඉලෙක්ට්‍රොනික පාදක සේවාවන, විධි ක්‍රම හා මෙවලම් සුලබව එදිනෙදා ජීවිතයටත්, රාජ්‍ය පාලනය ඇතුලු සියලු ක්ෂේත්‍රවල යොදා ගනිමින් අපේ රටට නව ආර්ථික විශේෂාංගයක් හඳුන්වාදීමට ක්‍රියා කරන්නෙමු. මේ අනුව වසර 2005 වනවිට තොරතුරු තාක්ෂණය මත පදනම් වූ කළමනාකරන ප්‍රවේශයක් සමාජයේ සියලුම ස්ථරයන්ට ගලා යාමට අවශ්‍ය මූලෝපායයන් දැනටමත් සම්පාදනය වී ඇති අතර අපගේ ඊළඟ රජය මගින් එවා වහා ක්‍රියාත්මක කරනු ඇත. ඒ අනුව

1 ඉලෙක්ට්‍රොනික වාණිජ කටයුතු (e-commerce)
2 ඉලෙක්ට්‍රොනික රාජ්‍ය පාලනය (e-govermence)
3 වෙබ් තාක්ෂණය (Web Technology)

යන ත්‍රිමංසිඳ ඇසුරින් රටේ සියලුම ක්ෂේත්‍රයන් තුළ දැනුම පාදක කරගත් කර්මාන්තයක් සහ තොරතුරු තාක්ෂණයෙන් උපරිම ප්‍රයෝජනයට ගන්නා කළමනාකරන (Management of Convergence) වැනි ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය සඳහා වන කර්මාන්ත ආරම්භ කිරීමට අපගේ රජය විසින් ඉහලම ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

---

[illegible]

1977-1994 කාලයේ සිදු වූ පෞද්ගලික කරණ වැඩ සටහන මගින් එ.ජා.ප. රජය විසින් දැඩි ලෙස කොල්ල කෑමට ලක්කළ මෙම ක්ෂේත්‍රයේ වතු අක්කර දහස් ගණනින් එම රජයේ නායකයින් සිය පෞද්ගලික ගණුදෙනුවට අත්පත් කර

බව අනුසරව තොරතුරු තාක්ෂණය හා විදුලි ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ ආයතන පිහිටුවීමටත් මෘදුකාංග අපනයන ක්ෂේත්‍රයට අවශ්‍යවන ආකාරයට රටේ පවත්නා ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතිය (Copyright law) සංශෝධනය කිරීමටත්, ඉහළ තත්වයේ මෘදුකාංග කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් නිර්ණය කිරීමට හා පරීක්ෂාකිරීම සඳහා ප්‍රමිති ආයතනයක් වහාම පිහිටුවමින් තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ප්‍රවර්ධනය විකිණීම සහ ඊට අවශ්‍ය ආයෝජනයන් ජාත්‍යන්තර වශයෙන් ලබා ගැනීමටත් තොරතුරු තාක්ෂණ සමාගම්වල ව්‍යවස්ථාපිත ආයතනයක් වහාම පිහිටුවීමටත් අපගේ මීළඟ රජය ඉහළම ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

එමෙන් ම තොරතුරු තාක්ෂණයේ මෙවලම් ලෙස පරිගණක යන්ත්‍ර භාවිතය දිරිගැන්වීම සඳහා වෘත්තිකයන් ශිෂ්‍යයන් ඇතුළු සියලු සමාජ ස්ථරයන්වලට අවශ්‍යවන මූලාධාර සැපයීමටත් ඒ වාගේ වෙළඳපොළ මිල අඩු කිරීමටත් සියලු අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් සැපයීමටත් කඩිනම් වැඩ සටහනක් ක්‍රියාත්මක කරන අතර එහි සියලු විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සඳහා විවෘත අන්තර්ජාල පහසුකම් ලබා දීමටත් ක්‍රියා කරනු ඇත.

රටේ සාමාන්‍ය ජනතාව අතර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ප්‍රශස්ථ මට්ටමක් කරා ගෙන ඒම අරමුණක් කර ගත් මූලෝපායයන් ක්‍රියාත්මක කිරීමටත් මෙම විෂයයන් විශ්ව විද්‍යාල ඇතුළු අනෙකුත් අධ්‍යාපනික ආයතනවල විෂය මාලාවන්ට ඇතුළු කිරීමටත් රාජ්‍ය ආයතන වාණිජ හා බැංකු පමණක් නොව අනෙකුත් සේවා ස්ථානවලටද මෙම ක්ෂේත්‍රයේ ' ප්‍රතිලාභ ලබාදීමටත් ක්‍රියාකරන අතර අපගේ ඊළඟ රජයේ සියලු අමාත්‍යාංශ මගින් ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා සිය වැය ශීර්ෂ මගින් මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමට ක්‍රියා කරනු ඇත.

## 7. කෘෂිකර්මය වැවිලි හා ධීවර කර්මාන්ත

### ගොවියා හා ගොවිතැන සුරැකීම

ගෝලීයකරණය හා වෙළඳපොළ ආර්ථික ක්‍රමය ප්‍රකටව ඇතිකර තිබෙන්නා වූ පරස්පරතාවයන්ගෙන් දේශීය ආර්ථිකයත් ජනතා ජීවනෝපායනුත් රැක ගැනීම පෙරදැරි කර ගත් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නගන පොදු පෙරමුණු රජය ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව (Food Security) ඇති කිරීමට පමණක් නොව වසර 2005 දී ලොව පුරා ඇතිවිය හැකි ආහාර අහේණියට අප රටට මුහුණ දිය හැකි අයුරින් අපගේ ආහාර නිෂ්පාදනය වැඩි දියුණු කිරීමටත් ඊට පිටුවහලක් සපයන ගොවියා හා ගොවිතැන සුරැකීමේ සුවිශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටත්, රජයේ ඉහළම ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

ගොවි ණය කපා හැරීමෙන් හා ගොවි රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම හඳුන්වාදීමෙන් ද, කෘෂි නිෂ්පාදන සඳහා සහතික මිලක් හඳුන්වාදීම, අලෙවි මධ්‍යස්ථාන ඇති කිරීම පමණක් නොව ගොවීන් සඳහා ඉඩම්, නිවාස, සහනාධාර ඇතුළු ප්‍රතිලාභ ඉමහත් සේ ලබා දුන් අප රජය ඉදිරියටත් මේ රටේ ගොවි පරපුරට උරුමව ඇති අභිමානය එලෙසම රැකදීම මූලික යුතුකමක් සේ සලකනු ලබන අතර මෙම ක්ෂේත්‍රයේ ආදායම් මට්ටම ඉහළ දැමීම තුළින් ගොවීන්ගේ ජීවනෝපායයන් හි පවත්නා අවදානම් තත්වයන් ඉවත් කිරීමටත්, එවාට ආනයනයන්ගෙන් ඇතිවිය හැකි තර්ජන වළකාලීමටත් අප රජයේ ඉහළම ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

කෘෂි කර්මාන්තය සඳහා නව ඉඩම්, වාරි ජලය, අඩු මිලට පොහොර, මෙවලම් හා යන්ත්‍ර සූත්‍ර පමණක් නොව තාක්ෂණික උපදෙස් හා ව්‍යාප්ති සේවාවන් තව තවත් පුළුල් වශයෙන් ලබා දෙමින් සහ මෙම ක්ෂේත්‍රය විවිධාංගීකරණයට ලක් කිරීම සහ නවීන තාක්ෂණය හා බද්ධ කිරීමෙන් ගොවියා ආරක්ෂා කිරීමටත්, අප රජයේ ඉහළම ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

උසස් වර්ගයේ බීජ නිෂ්පාදනය වැඩි කිරීම තුළින් නිෂ්පාදන බාරිතාව වැඩි කිරීමටත්, අල,ළූනු, මිරිස්,එළවළු හා කිරි ගොවීන් ආරක්ෂා කිරීමටත් එකී නිමැවුම්වල නිෂ්පාදන මිල අඩු කිරීමටත්, වෙළඳපොළ. ප්‍රවාහනයේ දී හා විකිණීමේ දී සිදුවන හානිය වළකා ලීමටත් පමණක් නොව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ළංවන කෘෂි ක්ෂේත්‍රයක් රටතුළ ඇති කිරීමටත් අප රජය සැලසුම් කටයුතු කරනු ඇත.

### වැවිලි කර්මාන්තය

1977-1994 කාලයේ සිදු වූ පෞද්ගලීකරණ වැඩ සටහන මගින් එ.ජා.ප. රජය විසින් දැඩි ලෙස කොල්ල කෑමට ලක්කළ මෙම ක්ෂේත්‍රයේ වතු අක්කර දහස් ගණනින් එම රජයේ නායකයින් සිය පෞද්ගලික හිතවතුනට අත්පත් කර

ගන්න. ඒ.ජා.ප.යේ හිතවතුන් අතර බෙදාගත් මෙම ජාතික සම්පත් යළි අප රටේ ප්‍රධාන ආර්ථික ව්‍යවසායකත්වයක් කිරීමට අවශ්‍ය මූලික කටයුතු දැනටමත් සිදුකර ඇති අතර මෙම ක්ෂේත්‍රය තිරසාර මට්ටමකට නැංවීම සඳහා එය විවිධාංගීකරණයකට ලක් කිරීමත්, මනා කළමනාකරණයක් ඇති කිරීමත්, නිෂ්පාදන මට්ටම් ඉහළ නැංවීමත්, නිෂ්පාදනයේ ඵලදායිතාව ඉහළ දැමීමත්, ඒ සඳහා අවශ්‍ය සුවිසාල ආයෝජනයන් සැපයීමත්, මෙම ක්ෂේත්‍රයේ නියැලී කම්කරුවන්ගේ ජීවනෝපායන් පමණක් නොව නිවාස හා මූලික යටිතල පහසුකම් ඇති කිරීමටත්, අප රජය විසින් දැනට ක්‍රියාත්මක කර ඇති වැඩ පිළිවෙල ඉදිරියටම ගෙන යනු ඇත. එමෙන් ම මෙම ක්ෂේත්‍රය මුහුණ පා තිබෙන ශ්‍රමික ඌනතා ගැටලුවට ප්‍රතිකර්මයක් වශයෙන් වතුවල වෙසෙන තරුණ තරුණියන්ට වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය ආකර්ෂණය කිරීම සඳහා සුවිශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

## ධීවර කර්මාන්තය

දශක දෙකක කාලයක් තිස්සේ පවත්නා යුධමය තත්ත්වය සහ උතුරු නැගෙනහිර ධීවර කර්මාන්තය අඩාල වීම නිසා දෙලක්ෂයකට අධික ධීවර පවුල්වල ජීවනෝපායන් බිඳ වැටී ඇති අතර අප රජය විසින් දැනට මේ ක්ෂේත්‍රය සඳහා ක්‍රියාත්මක කරනු ලබන [illegible] මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය ටොන් 240,000 ක හා මිරිදිය මත්ස්‍ය ටොන් 100,000 ක් දක්වා වන ප්‍රශස්ත මට්ටමකට ළඟාවීමටත් ධීවර හා ජලජ සම්පත් තිරසර මට්ටමකින් පවත්වාගෙන යාමට හා කළමනාකරණයට ලක් කිරීමටත් ධීවරයා සහ ධීවර කර්මාන්තය සුරැකීමටත් දැනට දී ඇති ඉහල ප්‍රමුඛතාව ඉදිරියේ දීද ක්‍රියාත්මක කරනු ඇත.

ධීවර තාක්ෂණය නවීකරණය කිරීමටත් එය විවිධාංගීකරණය කිරීමටත් කර්මාන්තයේ නියැලී ව්‍යවසායකයින්ට බැංකු ණය සහනාධාර ධීවර යාත්‍රා හා මෙවලම් පහසුවට හා දැරිය හැකි මිලට වෙළඳපොලේ සුලභ කිරීමටත් මත්ස්‍ය මෙන්ම ජල ජීවී සම්පත සංරක්ෂණය කිරීමටත් ක්‍රියා කරනු ඇත.

ධීවර පවුල් සඳහා නිවාස සැපයීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක වන අතර ඔවුන් දරිද්‍රතාවයෙන් මුදවා ගැනීමට හා සමාජ සංවර්ධනයට ලක් කරන බල මුලු ගැන්වීමේ සුවිශේෂ වැඩසටහනට අමතරව ධීවරයින්ගේ ජීවනෝපායන් සුරැකීමටත් ධීවර කර්මාන්තයට යොමු නොවන එම පවුල් වල තරුණ තරුණියන්ට විකල්ප රැකියා ලබා දීම සඳහාද සුවිශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත.

# 7. බල ශක්තිය

ග්‍රාමීය විදුලි බල පරිභෝජනය 1994 වන විට 36% ක් වූ අතර පොදු පෙරමුණු රජය යටතේ එය 51% දක්වා වැඩි කිරීමට හැකි වී ඇත. ඉදිරි පස් වසර තුළ මෙය 75% දක්වා වැඩි කිරීමට කටයුතු කරනු ඇත.

රටේ විදුලි පරිභෝජනය සඳහා වන ඉල්ලුම ඉහලයාමත් සමගම පවත්නා ජල විදුලි බලාගාර වලින් පමණක් කිසිසේත් සැපිරීමට නොහැකි [illegible] ඇති වූ නියඟය හේතුවෙන් විශාල බල ශක්ති අර්බුදයකට රට මුහුණ දුන්නේය. එහෙයින් ජල විදුලි බලාගාර තවත් සංවර්ධනය කරන අතරම විකල්ප විදුලි බලාගාර කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගනු ඇත.

# 8. නාගරික සංවර්ධනය

වසර 2030 වන විට මේ රටේ මුලු ජන සංඛ්‍යාවෙන් 65% ක් නගරවල ජීවත්වන බැවින් ඊට මුහුණදීමට අවශ්‍ය මූලික සැලසුම් නිවාස හා නාගරික සංවර්ධනය සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ වාර්තාව මගින් අපි 1998 දී හඳුනා ගත්තෙමු .ඒ අනුව රටේ නාගරික ප්‍රදේශයන් 148 ක් දැනටමත් විධිමත් සංවර්ධන මාවතකට යොමු කිරීමට නම් කොට ඇති අතර කොළඹ නගරය ජාත්‍යන්තර මට්ටමේ නගරයක් කිරීමටත්, එය අපගේ වාණිජ කේන්ද්‍රය වශයෙන් සහ ශ්‍රී ජයවර්ධනපුර නගරය පරිපාලන කේන්ද්‍රය වශයෙන් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය මූලික වැඩ සටහන් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. දිවයිනේ සියලු දිස්ත්‍රික්ක ප්‍රධාන නගරයන් මෙන්ම අභිනවයෙන් හඳුනාගෙන ඇති සංවර්ධන කේන්ද්‍රයන් ගණනාවක් හරහා අපේ නගර තිරසර දිවි පෙවෙතකට සහ පරිසර හිතකාමී කාර්යක්ෂම සේවා මධ්‍යස්ථානයන් බවට පත් කරලීම අපගේ මූලික සංවර්ධන ප්‍රයත්නයයි. එහිදී අයාලේ යන නාගරික සංවර්ධන ක්‍රියාවලියක් වෙනුවට ක්‍රමවත් සැලසුම්ගත හා සංවර්ධන ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ක්‍රියාත්මක වන්නා වූ රජයේ වැඩ පිළිවෙල ඉදිරියටම ගෙනයනු ඇත.

නිවාස

ශ්‍රී ලංකාවේ ජාතික නිවාස සංචිතයෙන් 58% ක් පමණ ක්‍රමවත් ස්ථිර ඒවා නොවන අතර මහ කොළඹ ප්‍රදේශයේ පමණක් පවුල් 150000ක් පමණ ජීවත් වන්නේ මුඩුක්කු හා පැල්පත් වලයි. කොළඹ නගරයේ හරි අඩකම එම ඉරණමට ගොදුරු වී ඇත. රටේ පවත්නා නිවාස හිඟයට මුහුණ දීමට නම් වාර්ෂිකව නිවාස ඒකක 73000 ක් පමණ ඉදිරි වසර පහ තුළ අඛණ්ඩව සැපයිය යුතු වේ.

මේ සඳහා 1996 දී තුර්කියේ දී සම්මත කර ගත් ඉස්තාන්බුල් ප්‍රඥප්තියට ද අනුකූල ව ඉතා සාර්ථකව අප රජය විසින් 1998 ඇති කළ නිවාස හා නාගරික සංවර්ධන සංවර්ධනය සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ වාර්තාවේ නිර්දේශයන් අති සාර්ථකව ක්‍රියාත්මක කරමින් සිටින්නෙමු

නාගරික මුඩුක්කු හා පැල්පත් ජනාවාසිකයින්ට නව නිවසක් සපයන වෙළඳපල පාදක කරගත් තිරසර පුරවර වැඩසටහන සංකල්පය ඉදිරියටම ගෙන යාමටත්, නාගරික හා ග්‍රාමීය නිවාස කරණයේ දී පුරා මූලික මූලෝපායන්ට (Eibling Approach®) ප්‍රමුඛතාව දීමටත් අඛණ්ඩව ක්‍රියාකරනු ඇත.

අධික පීඩනයකට ගොදුරු වී තිබෙන නාගරික ප්‍රදේශවල නිවාස කරණයේදී සිරස් සංවර්ධන මූලෝපායන් අනුව යමින් ක්‍රමිත බහුමහල් නිවාස සංකීර්ණයන් ඉදිකිරීමේලා අප විසින් අරඹා ඇති පුරෝගාමී මෙහෙවර ඉදිරියටද ක්‍රියාත්මක කෙරෙනු ඇත.

රටේ සමස්ථ සමාජගම නිවාස ඉදි කිරීමේ ක්‍රියාවලියකට යොමු කරන්නා වූ වෙළඳපල තත්වයන් ඇති කිරීමටත, ඉදිකිරීම් කර්මාන්තයට හා නිවාස හා දේපළ සංවර්ධනයට අදාළ පවත්නා නීතිමය, මූල්‍යමය හා ආයතනික අඩු ලුහුඬුකා ඉවත් කිරීමටත් අප විසින් අරඹා ඇති වැඩ පිළිවෙල අඛණ්ඩව ඉදිරියට ගෙන යන අතර තනි තනි වශයෙන් පෞද්ගලිකව ස්ව නිවාස සෑදීමේ යෙදී සිටින අතිශය බහුතරයගේ ස්වක්‍රියාවලියට රාජ්‍ය සහාය, අනුබලය හා දිරිදීමේ ප්‍රතිපත්තිය දැඩි ලෙස ක්‍රියාවට නංවනු ඇත.

## 9. යටිතල පහසුකම්

සැලසුම් සහගතව සංවර්ධනය කරමින් පවත්නා මානව ජනාවාස, නව නගර හා සංවර්ධන කේන්ද්‍රයන් හි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන්නා වූ සියලු නව මාර්ග, ගුවන් තොටුපළ, වරාය, බලශක්ති හා සන්නිවේදන ජාලයන් සහිත භෞතික යටිතල පහසුකම් පමණක් නොව ජල සම්පාදනය හා ජලාපවාහනය, සනීපාරක්ෂක සේවා, මළාපවහන පද්ධති, යන පාරිසරික යටිතල පහසුකම් ද සැලසුම් සහගතව හා විධිමත් සම්බන්ධීකරණයක් මගින් සිදු කිරීමටත් එම ජාතික ඉලක්කයන්ගෙන් 75% අපගේ මීළඟ රජය මගින් සම්පූර්ණ කිරීමටත් ක්‍රියාකරනු ඇත.

## 10. ප්‍රවාහනය

වසර 2030 දක්වා මේ රටේ මූලික අවශ්‍යතා පමණක් නොව සංවර්ධන දිශානතීන් පිළිබඳවත් පුළුල් දැක්මක් ඇති අප රජය සංවර්ධනයේ අභිනාලම් වන ප්‍රවාහන පද්ධතිය සවිශක්තිමත් කිරීමට හා විස්තාරණය කිරීමටත්, [illegible] මහා මාර්ග හා දුම්රිය මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීමට පමණක් නොව සියලු ප්‍රවාහන මාධ්‍යයන් හා සේවාවන් ද විධිමත් ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමටත් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් හි ආයෝජනයන් සුවිශාල වශයෙන් යොමු කරනු ඇත. මේ අතර දැනටම ක්‍රියාත්මක වන කොළඹ මාතර, කොළඹ- කටුනායක අධිවේගී මාර්ගයන්ට අමතරව කොළඹ හා ත්‍රිකුණාමලය යා කරමින් ඉදිවීමට නියමිත සංවර්ධන මංපෙත (Development Corridor)හා නව හම්බන්තොට වරාය ද ප්‍රමුඛතාවයක් ගනු ඇත.

## 11. පරිසරය

1992 මිහිකත සමුළුවෙන් එළි දැක් වූ 21 වන සියවස සඳහා වූ සැළැස්ම (Agenda 21) පදනම් කර ගෙන ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත්, ජෛව විවිධත්වය හා දේශීය දැනුම අනාගත පරපුරේ උවමනාවන් සඳහා ආරක්ෂණය කරමින් හා සංරක්ෂණය කරමින්, වත්මන් සමාජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා අරපිරිමැස්මෙන් හා මනා

කළමනාකාරිත්වයකින් යුතු ව භාවිතයට ගන්නා වූ මූලෝපායන් ක්‍රියාත්මක කිරීමට අප රජය විසින් ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

වායු හා ජල ඇතුළු පරිසර සංරචකවල දූෂණය අවම කිරීම සඳහා වන රෙගුලාසි, නීති රීති ශක්තිමත් කිරීමටත්, සංවේදී පරිසර පද්ධතීන් සංවර්ධනයේ ගොදුරු වීමෙන් මුදවා ගැනීමට අවශ්‍ය සුවිශේෂ සංරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමටත් ඉහළම ප්‍රමුඛතාවය දෙනු ඇත.

# 12. විරැකියාව පිටු දැකීම

1994 දී ලක්ෂ 8කට වඩා (14.4%) තිබූ විරැකියාව 1999 වන විට ලක්ෂ 6 කට (8.6%) අඩු කිරීමට පොදු පෙරමුණු රජයට හැකි විය. එනම් විරැකියාව 50% කින් අඩු කිරීමට හැකි විය. ඉදිරි වසර දෙක තුළ දී එය 5% දක්වා අඩු කිරීමට ක්‍රියා කරනු ඇත.

ඉදිකිරීම් කර්මාන්තය ඇතුළු සම්ප්‍රදායික ක්ෂේත්‍රයන්ට සමගාමී ව තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය, ඇඟලුම් පාදක කර්මාන්ත වැනි නව ආරම්භක ව්‍යාපාරයන් ඔස්සේ දේශීය කර්මාන්තය විවිධාංගීකරණය කිරීම තුළින් රජය, පෞද්ගලික අංශය හා විදේශ රැකියා ක්ෂේත්‍රයේ ඇති රැකියා අවස්ථා පුළුල් කිරීමෙනුත් නව රැකියා අවස්ථා ලක්ෂ 4 ක් බිහි කිරීමට කටයුතු කරන්නෙමු.

සංවර්ධනයේ එන්ජිම ලෙස සැලකෙන පෞද්ගලික අංශය මගින් සේවා නියුක්තිය ඇති කිරීමට කරනු ලබන දායකත්වය වැඩි කිරීමට අවශ්‍ය සියලු දිරිගැන්වීම් රජය විසින් ලබා දෙනු ඇත.

රැකියා නැති තරුණයන් දස දහස් ගණනින් ස්වයං රැකියා ක්ෂේත්‍රයට යොමු කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව දැනුම, හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීමට, ඔවුන්ට අවශ්‍ය බීජ ප්‍රාග්ධනය( Seed Capital) ලබා දීමේ රජය හා පෞද්ගලික අංශයන් මගින් මෙහෙයවන සුවිශේෂ වැඩසටහන් අඛණ්ඩව ඉදිරියට ගෙන යාමටත්, ප්‍රමුඛතාව ලබා දෙනු ඇත .

# 13. දිළිඳුකම පිටු දැකීම

පුළුල් සමාජ සුරක්ෂිතතාවක් ඇතිකරනු වස් සමෘද්ධි ව්‍යාපාරය ප්‍රධානම දිළිඳු කම පිටුදැකීමේ වැඩසටහන ලෙස වඩාත් පාරදෘශ්‍යභාවයෙන් යුතුව ක්‍රියාත්මක කරමින් සමාජයේ පහළම ජන ස්තර සවිබල ගැන්වීමෙහිලා යොදවනු ඇත. ග්‍රාමීය හා නාගරික දිළිඳු කොටස් ඇතුළු සෙසු ඉලක්ක කණ්ඩායම් වෙත මෙම ව්‍යාපාරයේ ප්‍රතිලාභ ගලායාමට මෙන්ම සමෘද්ධි සමාජය රටේ ප්‍රධාන ආර්ථික ප්‍රවාහයට බද්ධ කිරීම තුළ ඔවුනට ද වෙළඳපල ආර්ථික ක්‍රමයේ උපරිම ප්‍රතිලාභ ළඟා කරලීමට මං සලසා දීම සහතික කරනු ඇත. ඒ අනුව සමෘද්ධි වැඩසටහන වර්ෂ 2005 වනවිට පහත සඳහන් ඉලක්ක කරා ලඟා වනු ඇත.

දුප්පතුන්ට තමන්ගේ ආදායම වැඩි කර ගැනීමට අවශ්‍ය සියලු මුදල් ආධාර ඇප කරුවන් හා උගස් ලබා ගැනීම් වලින් තොරව සමෘද්ධි බැංකුවලින් ලබාදීම.

දුප්පත් පවුල් වල ළමයින් මන්දපෝෂණයෙන් මුදවා ගැනීම.

දුප්පත් පවුල්වල සියළුම ළමුන් අනිවාර්යයෙන්ම පාසල් යැවීම.

දුප්පතුන්ගේ සියලු ආපදා හදිසි හා විශේෂ අවස්ථා වඩා ශක්තිමත් ලෙස ආවරණය කෙරෙන සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීම.

සමෘද්ධිලාභීන්ට ශක්තිමත් පරිපූර්ණ පෝෂණ රක්ෂණ ක්‍රමයක් ඇතිකිරීම

# අධ්‍යාපනය

සෑම දරුවකුටම ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය වශයෙන් ලබා දීමටත්, විශ්ව විද්‍යාල උපාධිය දක්වා රජයේ වියදමින් නිදහස් අධ්‍යාපනයක් ලබා දීමටත් අපගේ රජය කැප වී සිටී.

අපේ දූ දරු පරපුර ආත්ම විශ්වාසයෙන් යුතුව ස්ථාවර අභිමානයකින් යුතුව 21 වන ශත වර්ෂයට සූදානම් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් හි ප්‍රතිලාභ දිලිඳුම පාසල දක්වා සැපයෙන්නා වූ වැඩ පිළිවෙල සාර්ථක කිරීම අපගේ ඊළඟ රජයේ ඉහළතම ප්‍රමුඛතාවක් වනු ඇත

රටේ අධ්‍යාපනය විවිධාංගීකරණය කිරීමේදී හා නව ලොවට ගැලපෙන විශේෂඥතා දැනුම, අධ්‍යාපනය, පුහුණුව සහ මූලික දැනුම, ඊට මඩවම් කිරීම් සුවිශේෂ ආයතන ඇති කිරීමේදී පෞද්ගලික අංශය දැනුවත් කිරීමටත් ගැතිකාවක් සහිත රාජ්‍ය අංශයේ අධ්‍යාපන පුහුණු හා තාක්ෂණික ආයතන වලට නව ක්ෂේත්‍රයන් තුළට පිවිසීමටත් රජයේ ඉහලම දායකත්වය ලබා දීමට සැපයෙනු ඇත.

අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් මිස වරප්‍රසාදයක් නොවේ. එක පොදු ජන එක්සත් පෙරමුණු රජයේ සංකල්පය ජීවමාන කරන නිදහස් අධ්‍යාපනයට අපේ දරුවන්ට ඇති අයිතිය කිසි විටක අහිමි නොකරනු ඇත.

# 15. සෞඛ්‍යය

දිවයින පුරා කාර්යක්ෂමව හා විධිමත්ව ක්‍රියාත්මක වන රජයේ රෝහල් හා සෞඛ්‍යය සේවා ජාලයක් පවත්වාගෙන යාමටත්, සෑම දිස්ත්‍රික්කයකම අංග සම්පූර්ණ රෝහල් කීපයක් සහ සෑම පළාතකම විශේෂඥ වෛද්‍ය සේවා සහිත රෝහල් පද්ධතියක් ගොඩ නැගීම සඳහාත් වන අපගේ මූලෝපායයන් ඊ ළඟ රජය මගින් මුලුමනින්ම ක්‍රියාත්මක කරනු ඇත.

# 16. මානව සම්පත් කළමනාකරණය

## රාජ්‍ය සේවය

නව සියවසේ අභියෝග වලට මුහුණදිය හැකි පරිදි වඩාත් කාර්යක්ෂම හා ඉහල ඵලදායීතාවක් ඇති රාජ්‍යය සේවයක් ඇති කිරීම අරබයා ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණයන් ඉදිරියටම ගෙන යාමටත් සංවර්ධන කටයුතු මනා කළමනාකරණයකට ලක් කරනු පිණිස එය මුලුමනින්ම දේශපාලනීකරනයෙන් මුදවා ලීමටත් ක්‍රියාකරනු ඇත.

රාජ්‍ය සේවකයින්ගේ වැටුප් ආකර්ශණීය ලෙස වැඩි කිරීමට ක්‍රියා කළේ පොදු පෙරමුණු රජයයි. වැටුප් කොමිසමේ නිර්දේශ 2002 වසර ආරම්භයේ දී ක්‍රියාත්මක වනු ඇත

## වැඩකරන ජනතාව

නව සියවස තුළ කරළියට පැමිණෙමින් තිබෙන සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය සහ දැනුම පාදක කරගත් කර්මාන්ත (Knowledge Baded Indñtriē) ක්ෂේත්‍රයන් මෙන්ම සේවා අංශයන් හි පවත්නා සීඝ්‍ර පරිවර්තනයන් හමුවේ වැඩ කරන පන්තියේ සම්ප්‍රදායික මුහුණුවර බොහෙවින් වෙනස් වෙමින් පවතී. එක් අතකින් එම අභියෝගයන්ට මුහුණදීමට සරිලන අයුරින් මෙම පන්තිය සෑම අතකින්ම බලමුළු ගැන්වීමත්, වෙළඳපල අර්ථ ක්‍රමය තුළ නිර්මාණය වී ඇති නව කළමනාකරණ ප්‍රවේශයන්ගේ සාපේක්ෂ වාසිය වැඩ කරන ජනතාවට ලබාදීම පිණිසත් නව කළමනාකරණ රටාවක් තුළ ස්වාමි සේවක සබඳතා තහවුරු කිරීමට අවශ්‍ය ප්‍රශස්ථ පසුබිම නිර්මාණය කිරීමටත්, විශේෂයෙන්ම නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම හා ඉහල ඵලදායීතාවයක් ලබා ගැනීම සඳහා වැඩකරන පන්තියට ධනාත්මකව දායක කරවීමෙන් ඇති වන්නාවූ ලාභාංශයන් පෙරලා ඔවුන් වෙත ප්‍රතිලාභ වශයෙන් ලැබෙන්නා වූ සහභාගිත්ව කළමනාකරණ ප්‍රවේශයක් වෙත යොමු වීමටත්, එමගින් සමස්ථ වැඩ කරන ජනතාවගේ ම ජීවනෝපායයන් සුරක්ෂිත කිරීමට මෙන්ම

ඔවුන්ගේ සමාජ ආර්ථික තත්වයන් උසස් මට්ටමකට ගෙන එමටත් අපි කැපවී ක්‍රියා කරන්නෙමු.

## වෘත්තිකයින්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

සියලුම ක්ෂේත්‍රයන් නියෝජනය කරන වෘත්තිකයින්ගේ ගරුත්වය හා අයිතීන් සුරැකීමටත් ඔවුන්ට වෘත්තීය නිපුනතා ඔප නංවා ගැනීමේ අවස්ථා පුළුල් කිරීමටත් ඔවුන්ට සුවිශේෂ වශයෙන් බලපාන්නාවූ ගැටලු විසඳීමෙහිලා ඉහළම ප්‍රමුඛතාවක් ලබා දීමේ පොදු පෙරමුණු රජයේ ප්‍රතිපත්තිය අපගේ නව රජය යටතේ එලෙසින්ම ක්‍රියාත්මක වෙනු ඇත.

## ආරක්ෂක සේවාවන්

රටේ දැනට පවත්නා යුද්ධය හා අස්ථාවර දේශපාලන පසුබිම තුළ ඉමහත් ලෙස කැපවීමෙන් රට දැය සුරැකීමේ නිරත සියලු ආරක්ෂක සේවාවන්හී සාමාජිකයනගේ වෘත්තීය අවශ්‍යතා පමණක් නොව ඔවුන්ගේ දරු පවුල්වල මූලික ගැටලු වන නිවාස රැකියා හා අධ්‍යාපන ගැටලු සඳහා මැදිහත්වීමටත් උදෙසා අප විසින් අරඹා ඇති වැඩසටහන් වඩාත් ශක්තිමත් කිරීමටත් ඔවුනට ලැබිය යුතු වන්දි මුදල් ඉක්මනින් ලබා දීමටත්, ක්‍රියාන්විත රාජකාරියේ දී ආබාධයට ලක්වූවන් රැක බලා ගැනීමටත් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්' අපගේ ඊළඟ රජය ද විසින්ද ලබා දෙනු ඇත.

## ජ්‍යෙෂ්ඨ පුරවැසියන්

ඉදිරි දශකය තුළ ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙන් 15% ක් පමණ වයස අවුරුදු 60 ඉක්මවන බැවින් ඔවුන්ගේ සමාජ හා ආර්ථික සුරක්ෂිතභාවය ඇති කරන විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කරන අතර ඔවුන්ගේ විශ්‍රාම වැටුප රු. 750 කින් වහාම ක්‍රියාත්මක වන පරිදි 2001 ඔක්තෝම්බර් මස සිට වැඩි කිරීමට ද ක්‍රියා කොට ඇත. එමෙන් ම මෙම සමාජ කණ්ඩායම් සුවිශේෂ වශයෙන් මුහුණ දෙන ගැටලුවලට පිළියම් යෙදීමට ද වහා මැදිහත් වන්නෙමු.

## කාන්තාවන් හා ළමයින්

කාන්තා ප්‍රඥප්තිය නීති ගත කෙරෙනු ඇත. එසේ ම පළමු වතාවට අප රජය විසින් ආරම්භ කරන ලද කාන්තා හා ළමා අයිතිවාසිකම් සුරැකීමේ වැඩසටහන තවත් ශක්තිමත් කිරීමටත්, රට පුරා කුඩා ළමයින් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීමට හා වැඩිහිටි නිවාස ඇති කිරීමටත් ඉදිරි පස් වසර තුළ අප රජය ක්‍රියා කරනු ඇත.

## 17 විදේශ ප්‍රතිපත්තිය

අපගේ ජාතික අභිලාශයන්, හිමිකම් මූලිකත්වයෙහිලා සලකමින් ශ්‍රී ලංකාව ආර්ථික සමාජීය හා දේශපාලනය වශයෙන් අභිමානවත් ව හා සමානාත්මතාවයෙන් යුතුව ජාත්‍යන්තර කරලියට ප්‍රවිශවීමට උපකාරීවන, මිත්‍රත්වය හා අන්‍යෝන්‍ය අවබෝධය මත පදනම් වූ විදේශ පිළිවෙතක් අනුගමනය කරන අතර, දැනට ජාත්‍යන්තර සබඳතා ක්‍රියාත්මක කිරීමේදී ජාත්‍යන්තර වෙළඳාමේදී හා ආයෝජනයන් යොමු කිරීමේදී මෙන්ම අන්තර්ජාතික දේශපාලන ගැටලුවලදීත්, අපට එරෙහිව ත්‍රස්තවාදී කටයුතු ක්‍රියාත්මක වීමේදීත්, ජාත්‍යන්තර වශයෙන් සිදුවන්නා වූ කොනෙහිලිකම් අවම කර ගැනීමටත් ගෝලීයකරණය ක්‍රියාවලිය ' ඉදිරියේ අප දේශයේ අවශ්‍යතාවයන් සුරැකීමත් ඉදිරිපත් වන්නා වූ දර්ශනයක් තුළ ප්‍රාදේශීය හා ජාත්‍යන්තර සංවිධාන සමග පොදු අරමුණු ඉටු කර ගැනීමටත් සර්වපාර්ශ්වික හා ද්විපාර්ශ්වික සබඳතා තුළින් එකිනෙකා බැඳෙමින් මිත්‍රශීලී බව ජාත්‍යන්තර සහයෝගය හා අන්‍යෝන්‍යය ගරු කිරීම පදනම් කර ගත් අපගේ භූ දේශපාලනමය යථාර්ථයන් හඳුනාගන්නා වූ වර්ෂ 1956 සිට අඛණ්ඩව අප විසින් පෝෂණය කළා වූ විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමටත් අපගේ ඊළඟ රජය ද කැපවෙනු ඇත.

ශ්‍රී ලාංකික පොදු ජනතාවගේ නිදහසේ සාමයේ සමෘද්ධියේ සෞභාග්‍යයේ පෙරමුණු බල ඇණිය
පොදු ජන එක්සත් පෙරමුණ දිගු කල් දිනේවා